**ශීර්ෂය 271 - ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 271 - ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමණාකරණ විගණන වාර්තාව 2017 සැප්තැම්බර් 28 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 432.00 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 420.72 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 11.28 ක් හෙවත් සියයට 2.61 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 378.00 | 367.20 | 10.80 | 2.86 |
| මූලධන | 54.00 | 53.52 | 0.48 | 0.88 |
| එකතුව | 432.00 | 420.72 | 11.28 | 2.61 |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යාංශ 17 ක් හා දෙපාර්තමේන්තු 10 ක් විසින් එකතුව රු. මිලියන 2,917.61 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට ඉන් රු. මිලියන 2,768.34 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබු ප්‍රතිපාදනවලින් රු. මිලියන 149.27 ක් හෙවත් සියයට 5.12 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල විෂය අංක 27101 යටතේ රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 26.00 | 25.80 | 16.00 | 21.89 | 100 | 78.50 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 95.06 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0002/0104/000 | 6.67 |
| 6000/0000/00/0013/0070/000 | 9.39 |
| 6000/0000/00/0014/0011//000 | 1.49 |
| 6000/0000/00/0016/0052/000 | 77.51 |
| **එකතුව** | **95.06** |

## 2.4 විගණන නිරීක්ෂණ

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් පත් අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදය දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන යාවත්කාලීන කර නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07ක් විසින් යාවත්කාලින කර නොතිබුණි. |
| (ආ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07ක් විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

### 3.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් එකකට 2017 සැප්තැම්බර් 20 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර එම විමසුමට අදාළ ගණනය කල හැකි ගනුදෙනු වල වටිනාකම රු. 6,536,677 ක් වී තිබුණි.

### 3.3 විසර්ජන ගිණුම

**අයවැය විචලනය**

වැය විෂයයන් 05 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 21 ත් සියයට 71 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 3.4 වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ලබාදුන් ප්‍රතිපාදන

### 3.4.1 බන්ධනාගාර ප්‍රතිසංස්කරණ පුනුරුත්ථාපන, නැවත පදිංචි කිරීමේ හා හින්දු ආගමික කටයුතු පිලිබඳ අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) <u>යටිතල පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය</u>

(i) කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොට්ටාඩි කන්දසාමි මලායි මාර්ගයේ සංවර්ධනය කිරීම පිලිබඳ භෞතික පරික්ෂාවේදී ඉදිකිරීම් නිම කර ඇති දුර මීටර් 1,300 ක් සඳහා ගෙවිය යුතු මුදල රු. 1,056,364 ක් වුවත් දුර මීටර් 2100 ක් වෙනුවෙන් රු. 1,603,855 ක් ගෙවා තිබූ නිසා ඉදිකිරීම් සිදු නොකරන ලද දුර මීටර් 800 ක් වෙනුවෙන් රු. 547,491 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ii) කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් විරච්චෝලය අභ්‍යන්තර මාර්ගය සංවර්ධනය කිරීමේදී, ඇස්තමේන්තු අනුව මාර්ගයේ මැද කොටස මූලික තාර යෙදීම, මැටල් සැපයීම, පළමු හා දෙවන තාර යෙදීම සිදු කර නොතිබුණි. ඒ බව කාර්මික නිලධාරි තහවුරු කර තිබියදීත්, වර්ග මීටර් 90 ක් වෙනුවෙන් රු. 112,050 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(iii) කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් පරයන්තාරු කන්දස්වාමි මලායි මාර්ගය සංවර්ධනය කිරීමේදී ඉදිකිරීම් නිමකර තිබූ දුර මීටර් 775 ක් වෙනුවෙන් ගෙවිය යුතු මුදල රු.512,925 ක් වුවත් මාර්ගයේ බිම් සැකසීම, බොරළු සැපයීම, බොරළු ඇතිරීම හා තැලීම සිදුකර නොතිබුණි. ඒ බව කාර්මික නිලධාරි තහවුරු කර තිබියදී, දුර මීටර් 1210 ක් වෙනුවෙන් රු.777,086 ක් ගෙවා තිබුණි. මේ අනුව ඉදිකිරීම් සිදු නොකරන ලද දුර මීටර් 435 ක් වෙනුවෙන් රු.264,161 ක් වැඩිපුර ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) <u>ජීවනෝපාය සහාය ව්‍යාපෘතිය</u>

(i) නැවත පදිංචි කරන ජනතාව සඳහා ජීවනෝපාය සහාය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පෙර ජනතාව නැවත පදිංචි කර වීම සිදු කල යුතු විය. කෙසේ වුවද, 2016 වර්ෂයේදී ඊට පටහැනිව මුතූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් සාම්පූර් බටහිර ග්‍රාම නිලධාරි වසමේ නැවත පදිංචි කර නොතිබූ පවුල් 07 ක් වෙත රු.700,000 ක් වටිනාකම සහිත කෘෂි උපකරණ ලබාදී තිබුණි.

(ii) නැවත පදිංචි කරන ජනතාවට කෘෂි උපකරණ ලබාදීමේදී ඒවා භාවිතා කිරීමට ප්‍රමාණවත් ජල පහසුකම් සහිත ජනතාව වෙනුවෙන් අදාළ ප්‍රතිලාභ ලබා දිය යුතු විය. කෙසේ වුවත්, ඊට පටහැනිව මුතූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සාම්පූර් ග්‍රාම නිලධාරී වසමේ ජල පහසුකම් නොතිබූ ප්‍රතිලාභීන් 9 දෙනෙකු සඳහා රු. 900,000 ක වටිනාකමක් සහිත කෘෂි උපකරණ ලබා දී තිබුණි.

(iii) මුතූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සාම්පූර් ග්‍රාමනිලධාරී වසමේ නැවත පදිංචි වූ පවුල් 04 ක් වෙත 2016 වර්ෂයේදී ලබාදී තිබුණු රු.400,000 ක් වටිනාකමක් සහිත කෘෂි උපකරණ විකුණා තිබුණි.

(iv) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2016 ජුනි 23 වන දින නිකුත් කරන ලද අංක JAT/EST/RESET/LIVE/2016 ලිපියේ iv ඡේදය අනුව ජීවනෝපාය සහය ව්‍යාපෘති සඳහා ප්‍රතිලාභීන් වෙත ලබා දෙන සතුන් විකිණීම හෝ වෙනත් අයෙකුට පැවරීම තහනම් වුවත් ඊට

පටහැනිව කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම සේවා වසම් 03 ක ප්‍රතිලාභීන් 7 දෙනෙකු වෙත ලබා දී තිබුණු රු. 700,000 ක වටිනාකමෙන් යුත් කිරි ගවයින් 07 දෙනෙකු විකුණා තිබුණි.

**3.4.2 ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ලැබුණු ප්‍රතිපාදන යටතේ ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීම පිලිබඳ පරීක්ෂාව**

2016 දෙසැම්බර් 31 දිනට ඉදිකර වැඩ නිමකර තිබූ පදවි ශ්‍රීපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජයන්තිවැව පොදු ක්‍රීඩාපිටිය 2017 ජුලි 31 දක්වා ක්‍රීඩා සඳහා භාවිතා නොකිරීම නිසා ඒ සඳහා ගෙවන ලද රු. 788,519 ක් නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.

**3.4.3 ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව ප්‍රතිපාදන වලින් ග්‍රාමීය ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීමේ වැඩසටහන පිලිබඳ පරීක්ෂාව**

සේරුවිල මහජන ක්‍රීඩාංගනය සංවර්ධනය සඳහා 2016 වර්ෂයේදී පස් පිරවීම සඳහා රු. 844,200 ගෙවා තිබුණු නමුත් පිටතින් පස් ගෙනා බවට සාක්ෂි ඉදිරිපත් නොවූ අතර ගල් ඉවත් කිරීම හා සමතලා කිරීම සඳහා රු. 64,000 ක් ගෙවා තිබූ නමුත් 2017 අගෝස්තු 30 වන විටත් ගල් ඉවත් කර නොතිබුණි.

**3.5 පොදු තැන්පතු ගිණුම**

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු. 11,088,121 වූ තැන්පතු 169 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.

**3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 27101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේ දි පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.3,746,490 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 06 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) විශ්‍රාම ගිය හා මිය ගිය නිලධාරීන්ගේ අත්තිකාරම් ශේෂයන් ආපසු අය කිරීම සම්බන්ධව ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 04 ඡේදය අනුව කටයුතු කර නොතිබීම හේතුවෙන් 1996 – 2015 කාලය තුල විශ්‍රාම ගිය නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 318,735 ක ණය ශේෂයන් 2016 වර්ෂය තුල දී චලනය නොවූ ණය ශේෂයන් ලෙස පැවතුණි.

(ඇ) 2006 - 2016 කාල පරිච්ඡේදය තුල සේවය හැරගොස් තිබූ නිලධාරීන් 10 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 1,102,045 ක ණය ශේෂයන් අය කිරීම සම්බන්ධව ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද අනුව කටයුතු නොකිරීම හේතුවෙන් 2016 වර්ෂය තුල දී ද අය වී නොතිබුණි.

(ඈ) 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව එක් නිලධාරියකුට ගෙවිය යුතු උපරිම ආපදා ණය මුදල රුපියල් 250,000 ක් වුවත් ඊට පටහැනිව වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරියකු වෙත රුපියල් 296,370 ක්ද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරියකු වෙත රු.285,740 ක්ද, ආපදා ණය සමාලෝචිත වර්ෂයේදී ලබා දී තිබුණි.

**3.7** **වත්කම් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) නිෂ්ක්‍රිය හා ඌන උපයෝජන වත්කම්.**

--------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2009 වර්ෂයේදී භාවිතයෙන් ඉවත් කරන ලද යතුරුපැදි 14 ක්, කැබ් රථ 04 ක්, ජීප් රථයක් හා ලොරියක් අපහරණය කිරීමට හෝ අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු නොකර නිෂ්කාර්යව ගාල් කර තිබුණි.

(ආ) 2010 දෙසැම්බර් 10 දින ආපදා කලමනාකරණ අමාත්‍යාංශයෙන් පදවි ශ්‍රීපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබී තිබුණු ජල පිරිපහදු කිරීමේ යන්ත්‍රයක්, කාර්යාල පරිශ්‍රයේ සවිකිරීම සඳහා අවශ්‍ය ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2016 වර්ෂයේදී රු.154,825 ක් වියදම් කර තිබූ අතර 2017 ජුලි 20 වන විටත් එම යන්ත්‍රය මෙන්ම ගොඩනැගිල්ලද නිශ්කාර්යව පැවතුණි.

**3.8** **අනුකූල නොවීම්**

-------------------

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

----------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|
| | රු. | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (අ) මුදල් රෙගුලාසි 94 | 444,687 | ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට බැඳී තිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 371 | 236,594 | කුච්චවෙලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් වෙත අවස්ථා 10 කදී, ලබා දී තිබුණු තත්කාර්ය අත්තිකාරම් වසරක කාලයක් ප්‍රමාද කර පියවා තිබුණි. |
| (ඇ) මුදල් රෙගුලාසි 880 | - | සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඇප තැන්පත් කල යුතු නිලධාරීන් 06 දෙනෙකු විසින් ඇප තැබීමට කටයුතුකර නොතිබුණි. |

## 3.9 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු සහ හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් වාහන 07 ක් 2002-2014 අතර කාලයේදී අනතුරුවලට ලක්වීම නිසා රු.2,706,380 ක පාඩුවක් සිදු වී තිබුණු අතර ඒවාට අදාළව පරීක්ෂණ අවසන් නොවීම නිසා 2016 දෙසැම්බර් 31 වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) 2005 වර්ෂයේදී භාණ්ඩාගාර විවිධ අත්තිකාරම් ගිණුම යටතේ වී මිලදී ගැනීම සඳහා සතොස ආයතනයට ලබාදී තිබුණු රු. 1,652,916 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.10 විසඳා නොතිබුණු විගණන ඡේද

| විගණකාධිපති වාර්තාවට යොමුව - වර්ෂය | විගණකාධිපති වාර්තාවට යොමුව - ඡේද අංකය | යොමුගත විෂයය |
|---|---|---|
| 2014 | 3.9(අ) | **වෙනත් ආයතනය සතු වත්කම් නීත්‍යානුකූලව පවරා නොදීම**<br>2011 ඔක්තෝබර් මස දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පවත්වා ගෙන ගිය ත්‍රිකුණාමලය පේදුරු කොටුවේ අක්කර 372 ක භූමිය හා එහි පිහිටි ගොඩනැගිලි හා නිවාස ඇතුලත්ව පුරා විද්‍යා භූමියක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති අතර එහි අයිතිය පවරා දෙන ලෙස පුරා විද්‍යා අධ්‍යක්ෂක ජනරාල්ගේ 2011 ජනවාරි 04 දිනැති අංක M/EP/1/7A දරන ලිපියෙන් දැනුම් දී ඇතත් 2017 අගෝස්තු 30 දක්වා නිත්‍යානුකූලව පවරා දී නොතිබුණි. |
| 2014 | 3.9 (ආ) | ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිහිටි ඉඩම රාජ්‍ය දැව සංස්ථාවට අයත්ව පවතින නමුත් එහි නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට 2017 අගෝස්තු මාසය වනවිටත් කටයුතු කර නොතිබුණි |
| 2014 | 03.13 (ඇ) | විල්ගම කැලය මැද පරිසර උද්‍යානයක් වටා අලිවැට සකස් කිරීමට සපයා තිබූ උපකරණ අනාරක්ෂිතව නිශ්කාර්යව පැවතුණි. වර්තමානය වන විට අදාල පරිසර උද්‍යානයේ ඉදිකිරීම් නතර කර තිබුණි. |

## 3.11 කළමනාකරණ දුර්වලතා

(අ) 1950 අංක 09 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 33 වගන්තිය අනුව ඉඩම් අත්පත් කර ගැනීමේදී ඉඩම් හිමියන් වෙත ගෙවිය යුතු වන්දි මුදල් ගෙවීමට පෙර ඔවුන් මියගොස් ඇත්නම් අදාළ ගෙවිය යුතු මුදල දිසා අධිකරණයක හෝ අනලත් අධිකරණයක තැන්පත් කිරීමට කටයුතු කල යුතුය. එසේ වුවද, කුච්චවෙලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ගොපාල්පුරම් නාවික හමුදා කඳවුර

සඳහා අත්පත් කර ගන්නා ලද ඉඩම් වෙනුවෙන් වන්දි ලැබීමට සුදුසුකම් ලැබූ ප්‍රතිලාභීන් දෙදෙනකු මියගොස් සිටියදී ඔවුන්ට ගෙවිය යුතු රු.15,400,000 ක් සඳහා චෙක්පත් 02 ක් අදාළ හිමිකරුවන්ගේ නමින් ලියා කාර්යාලයේ රඳවාගෙන තිබුණි.

(ආ) 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනතේ 31 (උ) සහ (ඌ) වගන්ති වලට අනුව කලපුව ආශ්‍රිත ප්‍රදේශ වල සංවර්ධන ව්‍යාපෘති කිරීමේදී වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවසරය ලබා ගත යුතු විය. කෙසේ නමුත්, එසේ අවසර ලබා නොගෙන කින්නියා සහ මුතූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල කළපුව ආශ්‍රිත ප්‍රදේශවල ක්‍රීඩාපිටි ඉදිකිරීම් හා පස් පිරවීමේ ව්‍යාපෘතීන් සඳහා එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් රු. 6,903,366 ක මුදලක් ගෙවා තිබුණි.

(ඇ) වන රක්ෂණ සීමාව තුල ඉදිකිරීමක් සිදු කිරීමට පෙර ඒ සඳහා වන රක්ෂණ දෙපාර්තමේන්තුවේ නිසි අවසරය ලබාගත යුතු වුවත් ඊට පටහැනිව කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කාක්කාමුනෙයි ක්‍රීඩා පිටිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් කඩොලාන රක්ෂිත සීමාව තුල ඉදිකරමින් පැවතුනි.

## 3.12 මානව සම්පත් කළමණාකරණය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යේෂ්ඨ මට්ටම | 40 | 35 | 05 |
| (ii) | තෘතීක මට්ටම | 36 | 15 | 21 |
| (iii) | ද්විතීක මට්ටම | 825 | 495 | 330 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 145 | 119 | 26 |
| | | 1046 | 664 | 382 |

(ආ) භාෂා පරිවර්ථක සේවයේ නිළධාරීන් 12 දෙනෙකුගේ පුරප්පාඩු පැවතීම හේතුවෙන් භාෂා 02 කට වැඩි ප්‍රමාණයක් කතා කරන මෙම දිස්ත්‍රික්කයේ ජනතාවට ප්‍රමාණවත් සේවයක් සැපයීමට බාධාවක් වී තිබුණි.